**නැගෙනහිර පළාතේ ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - 2013**

නැගෙනහිර පළාතේ ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (ජජාසනි) අතර 2010 මාර්තු 26 දින එළඹි අංක එස්එල්- පී97 දරන ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 4 (7)(අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

නැගෙනහිර පළාතේ ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, නැගෙනහිර පළාත් සභාව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන අතර, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය මඟින් ආර්ථික කටයුතු, වෙළඳපොළ පහසුකම් හා නිෂ්පාදන මධ්‍යස්ථානවලට ප්‍රවේශය වැඩිදියුණු කිරීම මෙන්ම සමාජ සේවා සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම මඟින් නැගෙනහිර පළාතේ ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා සහ එමගින් දේශීය ආර්ථික සංවර්ධනය හා ප්‍රාදේශීය අසමානකම් අවම කිරීම සඳහා දායකත්වය සැපයීමයි. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 5,834 කට සමාන ජපන් යෙන් මිලියන 4,664 ක් වන අතර, එයින් රු. මිලියන 4,944 කට සමාන ජපන් යෙන් මිලියන 3,965 ක් මූල්‍යායනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය එකඟ වී තිබුණි. 2010 මාර්තු 26 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර, 2014 ජනවාරි වනවිට නිම කිරීමට නියමිත විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ

අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍යයැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් , ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) විශේෂ යෙන් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව සහ ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3. මතය**

**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 5 ජේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ යෙන් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ එම ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව ,

(ඇ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණය සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණු බව සහ,

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

### 4.1 මූල්‍ය කාර්ය සාධනය

මූල්‍ය ප්‍රකාශනවලට සහ විගණනයට ලබා ගත හැකිවූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.2,036,594,207 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.5,634,640,807 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම සාරාංශ කර පහත දැක්වේ.

| සංරචක | 2013 වර්ෂය සඳහා වියදම | 2012 වර්ෂය සඳහා වියදම | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 1,825,586,628 | 1,994,709,433 | 4,916,461,578 |
| උපකරණ | - | - | 8,834,466 |
| උපදේශක සේවා | 12,962,646 | 22,947,386 | 64,850,135 |
| පරිපාලන පිරිවැය | 44,586,297 | 52,542,712 | 155,979,859 |
| බදු | 142,640,497 | 207,768,153 | 448,666,937 |
| බැඳීම් ගාස්තු | 929,823 | 3,824,825 | 10,598,972 |
| පොලී ගාස්තු | 9,888,316 | 16,290,016 | 29,248,860 |
| එකතුව | 2,036,594,207 | 2,298,082,525 | 5,634,640,807 |

**4.2 විශේෂ යෙන් ගිණුම**

මුල්‍ය ප්‍රකාශනවලට හා ලබාගත හැකිවූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ විශේෂ යෙන් ගිණුමේ මෙහෙයුම් හා 2013 දෙසැම්බර් 31 දිනට ගිණුමේ පැවති ශේෂය පහත දැක්වේ.

| | 2013 | |
|---|---:|---:|
| | ජපන් යෙන් | රු. |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 391,779,111 | 579,793,906 |
| එකතු කළා :- ඌන පූරණයන් | 1,409,610,769 | 1,836,893,243 |
| | 1,801,389,880 | 2,416,687,149 |
| අඩු කළා :- ආපසු ගැනීම් | 1,371,741,739 | 1,788,381,889 |
| විදේශ විනිමය පාඩුව | - | 92,952,641 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 429,648,141 | 535,298,619 |

**5. විගණන නිරීක්ෂණ**

**5.1 ගිණුම්කරණ අඩුපාඩු**

මාර්ග පුනරුත්ථාපන වැඩ 39 ක යෙදී සිටි කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද අතුරු ගෙවීම්වලින් අඩුකර ගන්නා ලද රු.135,427,263 ක් වූ රඳවා ගැනීම් මුදල් ව්‍යාපෘතියේ වගකීම් ලෙස හඳුනාගෙන නොතිබුණි. එබැවින් 2013 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන සිවිල් වැඩ වටිනාකම හා ගෙවිය යුතු රඳවා ගැනීම් මුදල් එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

**5.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව එක් එක් වර්ෂය අවසානයේ පැවැත්විය යුතු භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි. එබැවින් රු.7,001,512 ක් වටිනාකම වූ ස්ථාවර වත්කම් පිළිබඳ භෞතික පැවැත්ම විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය.

**6. මුල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**6.1 අරමුදල් උපයෝජනය**

අරමුදල් මූලායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබ වැදගත් දත්ත කීපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූලායනය සඳහා එකඟවූ මුදල | | 2013 වර්ෂික අයවැයෙහි කරන ලද වෙන්කිරීම | සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කරන ලද මුදල | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කරන ලද මුදල | |
|---|---:|---:|---:|---:|---:|---:|
| | යෙන් මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | යෙන් මිලියන | රු.මිලියන |
| ජජාසනි | 3,965 | 4,944 | 1,859 | 1,849 | 3,508 | 5,030 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ශ්‍රීලංරු | 699 | 890 | 229 | 187 | 476 | 604 |
| | -------- | ----------- | -------- | --------- | --------- | --------- |
| | 4,664 | 5,834 | 2,088 | 2,036 | 3,984 | 5,634 |

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) ණය ගිවිසුම අනුව, ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය විසින් රු.මිලියන 4,944 කට සමාන ජපන් යෙන් මිලියන 3,965 ක මුදලක් ව්‍යාපෘති කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. කෙසේ වුවද මුළු වෙන්කිරීමෙන් සියයට 89 ක් නියෝජනය වන එකතුව ජපන් යෙන් මිලියන 3,508 ක් 2013 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කර තිබුණි.

(ආ) පරිපාලන වියදම් හා වෙනත් දේශීය බදු සඳහා ශ්‍රී ලංකා රජය විසින් වෙන් කරන ලද රු.මිලියන 890 ක මුදලකින් එකතුව රු.මිලියන 604 ක් එනම් මුළු වෙන්කිරීමෙන් සියයට 68 ක් 2013 දෙසැම්බර් 31 දක්වා වැයකර තිබුණි.

**6.2 භෞතික කාර්ය සාධනය**

**6.2.1 කොන්ත්‍රාත් පරිපාලනය**

**(අ) ත්‍රිකුණාමලය, දිස්ත්‍රික්කයේ මාර්ග වැඩිදියුණු කිරීම් වැඩ**

මොර වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇතාබැඳි වැව මැද මාර්ගයේ, ඇතා බැඳි වැව මාර්ගයේ සහ රොට වැව මාර්ගයේ පළමු මං තීරුවේ කිලෝ මීටර් 1.9 ක් කොන්ක්‍රිට් ඇතිරීම සම්බන්ධයෙන් රු.16,633,991 ක් වටිනා කොන්ත්‍රාත්තුවක් 2011 පෙබරවාරි 12 දින ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

**(i) ඇතා බැඳි වැව මැද මාර්ගය**

★ කොන්ක්‍රිට් මිශ්‍රණයේ අඩු ගුණාත්මක තත්ත්වය හේතුවෙන් සමාහාරය නොරැඳීම (Dislodgement of Aggregate) නිවැරදි කිරීමේ අරමුණින් කිමී 0 + 000 සිට 0+100 හා කිමී 0+335 සිට කිමි 0+700 ස්ථානයන්හි කොන්ක්‍රිට් මාර්ගය මතුපිට බිටුමින් අතුරා තිබුණි.

★ තද කිරීම් පිළිබඳව සහ යොදාගත් අමු ද්‍රව්‍ය මිශ්‍රණය හා ශක්තිමත් බව පිළිබඳ තත්ත්ව පරික්ෂාව සිදුකර නොතිබුණි. ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ වාර්තාව අනුව, බාල මිශ්‍රණය හා යොදාගත් අමු ද්‍රව්‍යවල බාල තත්ත්වය හේතුවෙන් කිමී 0+100 සිට කිමී 0+310 දක්වා මීටර් 210 ක් දිගට කොන්ක්‍රිට් කිරීම සතුටුදායක නොවිය. එබැවින් මිමි 100 ක ඝනකමට කොන්ක්‍රිට් උඩින් ඇතිරීම මඟින් අඩුපාඩු නිවැරදි කර තිබුණි. කෙසේ වුවද උඩින් අතුරා තිබු කොන්ක්‍රිට් තට්ටුවේ ස්ථාන 9 ක මතුපිට පිපිරීම් නිරික්ෂණය විය. කොන්ක්‍රිට් තට්ටුව උඩින් ඇතිරීමේදී ප්‍රසාරණ කුස්තුර (expansion Joint ) විධිමත්ව සකස් කර නොතිබු බව තවදුරටත් නිරික්ෂණය විය.

**(ii)** ඇතා බැඳි වැව හා රොට වැව මාර්ගවල පළමු මංතීරු

-----------------------------------------------------

★ අදාළ කොන්ක්‍රීට් මාර්ග මතුපිට ආවරණය (cover aggregate ) සිදුකර නොතිබූ අතර කොන්ත්‍රාත්කරුට රඳවා ගැනීම් මුදල් මුදාහැරීමට පෙර අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

★ 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 වගන්තිය අනුව, කොන්ත්රාත්කරුට සියයට 90 ක ගෙවීම් සිදුකිරීමට පෙර ගෙවූ අත්තිකාරම් අයකර ගත යුතු විය. කෙසේ වුවද ගෙවූ අත්තිකාරම්වලින් සියයට 38 ක් නියෝජනය වන රු.1,266,399 ක් වූ අත්තිකාරම් පමණක් අවසාන බිල්පත්‍රය සඳහා ගෙවීම් කිරීමේදී කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගෙන තිබුණි.

(ආ) මඩකලපුව දිස්ත්‍රික්කයේ මාර්ග වැඩිදියුණු කිරීමේ වැඩ

-----------------------------------------------------------

මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුළු දිග කිමී 4.065 ක් වූ මාර්ග 10 ක් සම්බන්ධයෙන් රු.91,470,421 ක පිරිවැයකට කොන්ක්රීට් ඇතිරීමේ කොන්ත්‍රාත්තුවක් 2012 මැයි 22 දින ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ලංසුකරුවන් 5 දෙනෙකුගෙන් රු.54,998,282 ක් වූ අඩුම මිල ඉදිරිපත් කළ ලංසුකරු කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා තෝරා ගෙන තිබුණි. ලංසුකරු විසින් වැඩ සඳහා ඉදිරිපත් කළ මිල රේට ගණන්, වංචනිකව වෙනස් කර තිබුණු බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස මුල් ලංසුවට වඩා රු.91,470,422 දක්වා ලංසුමිල සියයට 66 කින් වැඩිවී තිබුණි. තවද සිදුකරන ලද වෙනස් කිරීම් පිළිබඳ යොමු වීමෙන් තොරව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසුව නිර්දේශ කර තිබුණි.

(ඇ) මතභේදාත්මක ගනුදෙනු

---------------------------

අත්තිකාරම් ඇප බැඳුම්කරය (Advance Guarantee Bond ) සඳහා ව්‍යාජ ලියකියවිලි ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) අංක පීආර්ආර්ඩීපී/ඊපී/බීටී/පී2/09 සහ අංක පීආර්ආර්ඩීපී/ඊපී/බීටී/ පී2/12 යන කොන්ත්‍රාත්තුවල මාර්ග පුනරුත්ථාපන වැඩ නිම කිරීම සඳහා කොන්ත්‍රාත්කරු අසමත්වීම හේතුවෙන් එම කොන්ත්‍රාත්තුවල යෙදී සිටි කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද බැංකු ඇප බැඳුම්කරය මත ලබාදී තිබූ එකතුව රු.4,950,000 ක්වූ අත්තිකාරම් ආපසු අයකර ගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් අදාළ වාණිජ බැංකුවට එම ඇප බැඳුම්කරය මුදල් කර ගැනීම සඳහා ඉල්ලීමක් කර තිබුණි. කෙසේ වුවද එම බැඳුම්කර බැංකුව විසින් නිකුත් නොකළ බව බැංකුව විසින් දන්වා තිබුණි. එබැවින් කොන්ත්‍රාත්කරු ව්‍යාජ ලියකියවිලි ඉදිරිපත් කර තිබූ බවට තහවුරු විය. ව්‍යාපෘතිය විසින් එම බැඳුම්කරය පිළිගැනීමට පෙර බැංකුවෙන් විමසීමට කටයුතු කර නොතිබූ අතර වංචනික බැඳුම්කරයක් ඉදිරිපත් කිරීම පිළිබඳව කොන්ත්‍රාත්කරුට එරෙහිව පියවර ගැනීමට හෝ බැංකුවෙන් විමසා බැලීමෙන් තොරව මෙම බැඳුම්කරය භාරගත් නිලධාරියාට එරෙහිව පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) ඉහත කරුණට අමතරව, කොන්ත්‍රාත් අංක පීආර්ආර්ඩීපී/ ඊපී/බීටී/පී2/12 මත මඩකලපුවේ පුද්ගලික වාණිජ බැංකුවකින් රු.1,539,600 ක් වටිනා කාර්ය සාධන බැඳුම්කරයක් ව්‍යාපෘතිය විසින් භාරගෙන තිබූ අතර, එකඟ වූ පරිදි කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් වැඩ සම්පූර්ණ නොකිරීම හේතුවෙන් පසුව එම කාර්ය සාධන බැඳුම්කරය මුදල් කිරීම සඳහා ඉල්ලීමක් කර තිබුණි. කෙසේ වුවද බැඳුම්කරයේ තබා තිබූ අත්සන ව්‍යාජ එකක් බව සඳහන් කරමින් බැංකුව විසින් බැඳුම්කරය මුදල් කිරීම ප්‍රතික්ෂේප කර

තිබුණි. ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුට එරෙහිව හෝ බැඳුම්කරයේ වලංගුභාවය බැංකුවෙන් පරික්ෂා කිරීමෙන් තොරව එය භාරගත් නිලධාරියාට එරෙහිව කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළදී රු.349,930,558 ක් වටිනා අනෙක් කොන්ත්‍රාත්තු 9 ක කාල පරිච්ඡේදය දීර්ඝ කර තිබූ බවත් තවදුරටත් නිරික්ෂණය විය. කෙසේ වුවද පෙර අවස්ථා වලදී ඉදිරිපත් කරන ලද කාර්ය සාධන ඇපකර වංචනික බවට නිරික්ෂණය වූ බව බැංකුව විසින් සඳහන් කර තිබූ අතර එම කාර්ය සාධන බැඳුම්කර දීර්ඝ කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි. කෙසේ වුවද වගකිව යුතු කොන්ත්‍රාත්කරුවන්ට එරෙහිව හෝ බැඳුම්කරවල වලංගු භාවය පිළිබඳ බැංකුවෙන් විමසීමක් කිරීමෙන් තොරව බැඳුම්කර භාරගත් නිලධාරියාට එරෙහිව කිසිඳු පියවරක් ගැනීමෙන් තොරව, අදාළ කොන්ත්‍රාත්කරුවන් විසින් පුද්ගලික අංශයේ රක්ෂණ සමාගමකින් ලබාගෙන ඉදිරිපත් කරන ලද නව බැඳුම්කර ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් පිළිගෙන තිබුණි.

(iv) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8 වගන්තිය අනුව, ලංසු ලියවිල්ලේ ලංසුකරු විසින් අත්සන් කර නොමැති නම්, ලංසුව අවලංගු කළ යුතු අතර තවදුරටත් සැලකිල්ලට ගැනීම නොකළ යුතුය. කෙසේ වුවද වටිනාකම රු.189,534,879 ක් වූ අංක පීආර්ආර්ඩීපී/ඊපී/බීටී/පී3/06 හා අංක පීආර්ආර්ඩීපී/ඊපී/බීටී/පී3/ 8 බී දරන කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් වූ ලංසු ලිය කියවිලි මත ලංසුකරු විසින් ඔහුගේ අත්සන තබා නොතිබුණද, ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණි.